**කළුතර ප්‍රාදේශීය සභාව - 2021**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**--------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

කළුතර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කළුතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ප්‍රමිතයේ 03 වගන්තිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කළයුතු ක්‍රමවේදයට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණ බව පහත කරුණු අනුව නිරික්ෂණය විය. | | පළාත්පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| • ප්‍රමිත අංක 6.1 ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ යනු නිෂ්පාදන හෝ භාණ්ඩ හෝ සේවා සැපයිම , වෙනත් අයවලුන්ට කුලියට දීම සඳහා හෝ පරිපාලනමය කටයුතු සඳහා භාවිතා කිරිමට තබාගෙන ඇති සහ එක් වාර්තාකරණය කාල පරිච්ජේදයකට වඩා වැඩි කාලයක් සඳහා භාවිතා කිරිමට අපේක්ෂා කරන ස්පෘශ්‍ය වත්කම් වේ. ඒ අනුව පුස්තකාල පොත් ඉහත නිර්නායක සම්පූර්ණ කරන බැවින් දේපළ, පිරියත හා උපකරණ යටතේ හඳුනාගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී රු.5,350,407 ක් වූ පුස්තකාල පොත් වටිනාකම තොග ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ නිවැරදි කිරිමට කටයුතු කරන බව | |
| • සමාලෝචිත වර්ෂය තුල දේපළ පිරියත මිලට ගැනීම් රු.34,427,120 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දේපළ පිරියත මිලට ගැනීම් රු.12,290,553 ක් විය. | | |
| • සමාලෝචිත වර්ෂයේ පොලි ආදායම රු.626,769 ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වන මුදල් ප්‍රවාහ යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | |
| (ආ)ප්‍රමිත අංක 6.10 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුල ක්ෂය කළයුතු රු.372,370,796 ක්වූ දේපළ පිරියත ක්ෂය කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව | නිවැරදිව ක්ෂය කර ගිණුම්ගත කළයුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය තුල රු.148,800 වැය කර මිලදී ගෙන තිබූ ෆයිබර් ඉනිමන් තුනක වටිනාකම යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම හර කරනු වෙනුවට තොග ගිණුම හර කර තිබුණි. | | |
| (ආ) ඉඩම් ලේඛනය අනුව හෙක්ටයාර් 59.2 වූ සභාව සතු ඉඩම් කට්ටි 59 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඇ)2021 වර්ෂය තුල කාර්යාල කාර්ය සහායකවරයෙකුට වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් ගෙන තිබූ රු.73,082 ක් ලැබිය යුතු දැ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| (ඈ)වස්කඩුව පැරණි ගොඩනැගිල්ලේ ඉහල මාලය පුස්තකාලයක් ලෙස නවීකරණය කිරිම සඳහා වැය කළ රු.786,765 ගෙඩනැගිලි ගිණුම හර කරනු වෙනුවට පුනරාවර්තන වැය ගිණුම හර කර තිබුණි. | | |
| (ඉ) 2020 වර්ෂයේදී ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.8,068,780 එම ප්‍රාග්ධන ප්‍රදානය යෙදවූ වත්කමට අදාල ක්ෂය ප්‍රතිශතයන්ට සමාන වටිනාකමක් ආසන්න වශයෙන් රු.8,068,780 ක් සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අයභාරය යටතේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරිම් ලෙස සටහන් කර නොතිබුණු බැවින් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| ගිණුම් විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 07 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා ඊට අනුරූපී වාර්තාවල දැක්වෙන වටිනාකම අතර රු.5,557,858 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන ශේෂයන් හා උපයෝගි ලේඛන ශේෂයන් සමාන විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.62,107,295 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.66,631,388 ක් විය.

## 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) හිඟ වරිපනම් බදු කාල විශ්ලේෂණයට අනුව වසර 07 ක් ඉක්මවූ හිඟ රු.505,221ද , වසර 04 – 07 ඉක්මවූ හිඟය රු.1,800,058 ද, වසර 01 – 03 ත් අතර හිඟය රු.5,167,805 ක් ද විය.<br><br>(ආ) වරිපනම් හිඟය පිළිබඳ පරීක්ෂාවේදී රු.20,000 ට වැඩි වරිපනම් හිඟය ඇති වරිපනම් බදු හිමියන් 11 දෙනෙකු නිරීක්ෂණය වූ අතර ඔවුන්ගෙන් අයකර ගත යුතු හිඟ ශේෂය රු.1,195,930 ක් විය. | පිළිතුරු ලබාදී නැත. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ඇ)පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 වර්ෂයේ සිට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.47,989,050 ක් හා 2019 වර්ෂයේ සිට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.132,878,009 ක් විය. | 2021 වර්ෂය සඳහා උසාවි දඩ මුදල් ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 වර්ෂයේදී සභා අරමුදල් රු.4,482,062 ක් වැය කර ඉදිකර තිබූ මොරොන්තුඩුව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 3 ක් වෙළඳ සංකීර්ණය ආරම්භ වූ 2006 වර්ෂයේ සිට බදු දී නොතිබුණි. | ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවූ බැවින් සභාවේ කටයුතු සඳහා යොදවා ඇති බව | කඩ කාමරබදු දීමට කටයුතු කළයුතුය. |